PR/2019/...

# ජපන් තානාපති කාර්යාලය

නො.20 ශ්‍රීමත් ආර්.පී.සේනානායක මාවත, කොළඹ 07
දුරකථනය: 94-11-269-3831~3, ෆැක්ස්: 94-11-269-8629
ඊ-මේල: cultujpn@sltnet.lk

පෙබරවාරි 26, 2019

## පුවත්පත් නිවේදනය

**ජපන් තානාපතිවරයා විසින් JDS ශිෂ්‍යත්වලාභීන් පිළිගනු ලබයි**



JDS ශිෂ්‍යත්වලාභීන්, රජයේ උසස් නිලධාරීන් සහ මුදල් අමාත්‍යංශයේ ලේකම් ආචාර්ය ආර්. එච්. එස් සමරතුංග මහතා ශ්‍රී ලංකාවේ ජපන් තානාපති අකිරා සුගියාමා මහතා සමග

ජපන් රජය මගින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයේ නියුතු විධායක ශ්‍රේණියේ තරුණ නිලධාරීන්, අනාගතයේ අදාල ක්ෂේත්‍රයන්හි නායකත්වය දැරීමට සුදුසු වන පරිදි ඔවුන්ගේ පරිපාලන කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් 2010 වර්ෂයේ සිට මානව සම්පත් සංවර්ධනය සඳහා වූ ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය (JDS) ක්‍රියාත්මක කරගෙන යනු ලබයි. මෙම ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය යටතේ රාජ්‍ය අංශයේ නිලධාරීන් 105 දෙනෙකු සඳහා රාජ්‍ය ප්‍රතිපත්තිය, රාජ්‍ය මූල්‍ය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර කළමනාකරණය සහ පරිසර කළමනාකරණය යනාදී ක්ෂේත්‍ර ඔස්සේ ද්‍ෑ අවුරුදු පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීමට අවස්ථාව සලසා දී ඇත.

මෙම වසරේ උපාධි පාඨමාලාවන් සම්පූර්ණ කර පැමිණි ශිෂ්‍යත්වලාභීන් පිළිගැනීම සඳහා 2019 පෙබරවාරි 26 වෙනි දින ශ්‍රී ලංකාවේ ජපන් තානාපති තුමා විසින් එතුමාගේ නිළ නිවසේදී භෝජන සංග්‍රහයක් පවත්වන ලදී. එහි ප්‍රධාන අමුත්තා ලෙස මුදල් අමාත්‍යංශයේ ලේකම් ආචාර්ය ආර්. එච්. එස් සමරතුංග මහතා සහභාගී විය. මෙම අවස්ථාව ඇමතූ ජපන් තානාපති සුගියාමා මහතා ප්‍රකාශ කර සිටියේ මෙම JDS ශිෂ්‍යත්වලාභීන් තමන් ලබාගත් ශාස්ත්‍රිය දැනුම, ප්‍රායෝගික අත්දැකීම් හා නායකත්ව ලක්ෂණ ශ්‍රී ලංකාවේ සංවර්ධනය ක්‍රියාවලිය වෙනුවෙන් යොදවමින් ජපානය සහ ශ්‍රී ලංකාව අතර ඇති ද්විපාර්ෂවිය සම්බන්ධතාවය තවදුරටත් ශක්තිමත් කර ගැනිමට දායක වනු ඇතැයි ජපන් රජය විශ්වාස කරන බවයි. (නිමි)

**************************************************************

වැඩි විස්තර සඳහා, කරුණාකර විමසන්න.

සංවර්ධන සහයෝගිතා අංශය, ජපන් තානාපති කාර්යාලය

දුරකථනය 011-2693831-3 (දිගු අංකය 226)